දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
දෙවන වාර පරීක්ෂණය - 2019

13 ශ්‍රේණිය | බෞද්ධ ශිෂ්ටාචාරය | විසඳුම් පත්‍රය

**I - පත්‍රය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. - 3 | 02. - 2 | 03. - 4 | 04. - 1 | 05. - 1 | 06. - 5 | 07. - 1 | 08. - 3 | 09. - 5 | 10. - 2 |
| 11. - 3 | 12. - 4 | 13. - 2 | 14. - 3 | 15. - 4 | 16. - 2 | 17. - 1 | 18. - 4 | 19. - 4 | 20. - 1 |
| 21. - 4 | 22. - 5 | 23. - 3 | 24. - 5 | 25. - 2 | 26. - 4 | 27. - 2 | 28. - 5 | 29. - 1 | 30. - 5 |
| 31. - 3 | 32. - 1 | 33. - 3 | 34. - 4 | 35. - 2 | 36. - 4 | 37. - 5 | 38. - 2 | 39. - 1 | 40. - 5 |
| 41. - 3 | 42. - 3 | 43. - 5 | 44. - 1 | 45. - 2 | 46. - 4 | 47. - 3 | 48. - 2 | 49. - 5 | 50. - 1 |

(2 × 50 = 100)

**II කොටස**

01. i. ඍග්වේදයේ 10වන මණ්ඩලයේ 90වන පුරුෂ සූක්තයේ බ්‍රහ්මණෝස මුඛ මාසීද්.... යනාදී ලෙස දක්වෙන ශ්ලෝකයට අනුව මහා බ්‍රාහ්මයාගේ මුඛයෙන් බ්‍රාහ්මණයන් ද දෙබාහුවෙන් ක්ෂත්‍රියන් ද කලවාවලින් වෛශ්‍යයන් ද යටි පතුලෙන් ශුද්‍රයන් ද බිහි වූ බව විස්තර විය යුතුය. (ල. 4)

ii. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව පුද්ගල ජීවිතය අවධි 04 කට බෙදා තිබුණි.

* බ්‍රාහ්මචාරි, ගෘහස්ථ, වානප්‍රස්ත සන්‍යාසි වශයෙනි.
* බ්‍රාහ්මචාරී : - ශිෂ්‍යයෙකු ලෙස වේදය හා ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමේ කාලයයි.
* ගෘහස්ථ : - විවාහ වී අඹුදරුවන් පෝෂණය කිරීම.

පස්කම් සුව අනුභව කරමින් සාර්ථක ගෘහ ජීවිතයක් ගත කිරීම.
පිරිමි පුතෙකු බිහි කිරීම අනිවාර්ය විය.

* වානප්‍රස්ත :- වන ගත වී තවුස් දම් රැකීම.
* සන්‍යාසි :- බ්‍රහ්මසහව්‍යතාවය පතමින් අනගාරිකව යෝගී ජීවිතයක් ගත කිරීම.

iii.
* සොළොස් මහා ජනපද අතර ප්‍රධාන රාජ්‍යයන් හතරෙන් එකකි.
* රාජාණ්ඩු පාලනය ක්‍රියාත්මක වූ මෙහි බුද්ධකාලීන පාලකයා වූයේ පසේ නදී කොසොල් රජුය.
* අගනුවරය වූයේ සැවැත් නුවරයි.
* සිදුහත් කුමරු උපන් කිඹුල්වත්නුවර කෝසල රාජ්‍යයට අයත් විය.
* සැවැත් නුවර අනේපිඬුසිටුතුමා විසින් ඉදි කළ ජේතවනාරාමයේ වසර 19 ක් ද විශාඛාව ඉදි කළ පූර්වාරාමයේ වසර 06 ක් ද බුදු රදුන් වස් වසා වැඩ සිටි බව සඳහන් වේ.
* ජේතවනාරාමය, පූර්වාරාමය, රාජකාරාමය කෝසල රාජ්‍යයේ පිහිටා තිබුණි.
* අංගුලිමාල දමනය සිදු වූයේ ද කෝසල රාජ්‍යයේ ය.

iv. මහාචාර්ය මැක්ස්මුලර්, මහාචාර්ය ලක්ෂ්මී නරසු, ඇල්බට් අයින්ස්ටයින්, බර්ට්‍රන්ඩ් රසල්, එඩ්වින් ආර්නෝල්ඩ්, මහාචාර්ය සෝන්ඩර්ස් යනාදීන් විසින් කරන ලද ඇගයීම් දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත්ය.

v. ත්‍රිවිද්‍යාඥාන නම්, පුබ්බේනිවාසානුස්සති ඥානය චුතුපාත ඥානය හා ආසවක්ඛය ඥානයයි.

* පුබ්බේනිවාසානුස්සති ඥානය යනු පෙර ජාතීන්හි ස්කන්ධ පරම්පරාව සිහිකර දැන ගන්නා නුවණයි. පෙර විසූ කඳ පිළිවෙල දැන ගන්නා නුවණ යනුවෙන් ව්‍යහාර කරන මෙම නුවණ උපදවා ගැනීමෙන් සසර පූර්ව ජාතිවල කිනම් භවයක උපත ලබා සිටියේ දැයි දැන ගත හැකිය.
* චුතුපපාත ඥානය :-
  සත්ත්වයන්ගේ චුතිය හා උප්පත්තිය දැන ගන්නා මෙම සුවිශේෂී ඥානය දිබ්බචක්ඛු ඥානය නමින් ද හඳුන්වයි. සසර ගත සත්ත්වයන් කිනම් භවයක කිනම් ආත්මභාව ලැබ කෙසේ එම ආත්මභාවය අත්හරී ද යන්නත්, නැවත කුමන ආත්මයක් ලැබ කිනම් තැනක උපදින්නේ ද යන්නත් විනිවිද දැකිය හැකි ඥානයයි.
* ආසවක්ඛය ඥානය : සියලු ආශ්‍රව දුරු කිරීමෙන් ලබන ඥානයයි. සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වූයේ මෙම ඥානය උපදවා ගැනීමෙනි.

02. i.
* කෝලිත පිරිවැජිය සමඟ වේළුවනාරාමයේ දී පැවිදි වූ උපතිස්ස පිරිවැජියා සැරියුත් හිමි නමින් ප්‍රකට විය.
* සූකරඛත ලෙනේ දී වේදනා පරිග්ගහ සූත්‍රය අසා රහත්ඵලය ලැබීය.

* ශ්‍රී සද්ධර්මය මැනවින් මතක තබා ගැනීම නිසා ධර්ම සේනාධිපති තනතුර ද හිමිවිය.
* මහා ප්‍රඥාවන්තයින් අතර අගතනතුර මෙන්ම දකුණත් සවු තනතුරු ලැබීය.
* පිරිනිවන් පෑමට පෙර මෑණියන් සෝවාන් ඵලයෙහි පිහිටුවීමට හැකිවිය.
* චාලා උපචාලා සිසුපචාලා යන තම සහෝදරියන් සසුන්ගත කරවා රහත් .......... බවට පත් කිරීමට හැකිවිය.
* ඉවසීමත්, නිහතමානී බවත් තුළින් සසුන් කෙත බැබලවීමට සමත්විය.
* ගැඹුරු දහම් කරුණු සරල ලෙස විස්තර කිරීමේ හැකියාව තිබුණි.

ii. ආකාරවතී ශ්‍රද්ධාව හා අමූලිකා ශ්‍රද්ධාව ලෙස ශ්‍රද්ධාවේ මූලික ප්‍රභේද දෙකකි. ආකාරවතී ශ්‍රද්ධාව යනු ප්‍රඥාවෙන් යුක්තව විමංසාවෙන් ඇති කරගන්නා අවබෝධයයි. ආකාරවතී ශ්‍රද්ධාව දර්ශනය මූලික කරගන්නකි. බුදුසමය පිළිගනු ලබන්නේ ආකාරවතී ශ්‍රද්ධාවයි. නිර්වාණ ගාමී ප්‍රතිපදාවේ ආරම්භක පදනම වනුයේ තෙරුවන් කෙරෙහි අවබෝධයෙන් ඇතිවන්නා වූ මෙම පැහැදීමයි.

iii. 1. නිතර රැස් වීම
2. සමගිව රැස්ව සමගිව සාකච්ඡා කර සමගිව විසිරයාම.
3. පෙර නොපැනවූ නීති නොපැනවීම, පැනවූ නීති කඩ නොකිරීම හා පැරණි වජ්ජි ධර්ම අනුගමනය කිරීම.
4. වැඩිහිටියන්ට ගරු බුහුමන් කිරීම හා ඔවුන්ගේ වචනවලට සවන් දිය යුතු බව පිළිගැනීම.
5. විවාහක හා අවිවාහක කාන්තාවන්ට කරදර නොකිරීම හා බලහත්කාරයෙන් වාසය නොකිරීම.
6. වජ්ජි රාජ්‍යය ඇතුළත හා පිටත පිහිටි පූජනීය ස්ථානවලට ගරුසත්කාර කිරීම හා ඒවා නඩත්තු කිරීම.
7. රහතුන්ට පහසුකම් සැලසීම, රටට පැමිණි රහතුන්හට එහි සුවසේ විසීමට සැලැස් වීම හා නොපැමිණි රහතුන් එහි පැමිණ වීම.

iv. ශිෂ්‍යයා විසින් ගුරුවරයාට ඉටු කළ යුතු යුතුකම්.
1. ගුරුවරයා දුටු විට පුනස්නෙන්නැගිට ආචාර කිරීම
2. ගුරුවරයාට උපස්ථාන කිරීම
3. ගුරුවරයාගේ අවවාදවලට මැනවින් සවන් දීම
4. ගුරුවරයාගේ අත්පා මෙහෙවර කිරීම
5. මැනවින් ශිල්ප ඉගෙන ගැනීම

ගුරුවරයාගෙන් ශිෂ්‍යයාවෙත ඉටුවිය යුතු යුතුකම්
1. ආචාර සමාචාරයන්හි මැනවින් හික්මවීම
2. ශිල්ප හොඳින් කියා දීම
3. තමා උගත් සියලු ශිල්ප ශිෂ්‍යයාට කියාදීම
4. තම මිත්‍ර ජනයාට ශිෂ්‍යයා හඳුන්වා දීම
5. බැහැරින් වන කරදර විපත්වලින් ශිෂ්‍යයා ආරක්ෂා කිරීම

v. * මෙත්තා, කරුණා, මුදිතා උපේක්ෂා යනු සතර බ්‍රහ්ම විහරණ බව
* ජනතාවගේ දුකේ දී පාලකයාගේ සිතෙහි අනුකම්පාව ඇති වීමයි.
* සසර දුකට පත්ව සිටින සත්ත්වයා දැක බුදුවරයකු තුළ ඇති වන අනුකම්පාව මහාකරුණාවයි.
* දෙමාපියන් තුළ ඇත්තේ ද කරුණාවයි.

03. i. අප්පමාදේන මඝවා - දේවානං සෙට්ඨතං ගතෝ
අප්පමාදං පසංසන්ති - පමාදෝ ගරහිතෝ සදා

ii. ශක්‍රයා දෙවියන් අතර ශ්‍රේෂ්ඨ වූයේ නොපමා බව නිසාය. (මඝවානවක දෙවියන් අතර ශ්‍රේෂ්ඨ වූයේ නොපමා බව නිසාය.) බුද්ධාදි උතුමෝ නිතරම නොපමා බව පසසත් ප්‍රමාදය හැම කල්හිම ගැරහුමට ලක්වෙයි.

iii. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි, අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි, අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි, මුසාවාදා වේ රමණී සික්ඛාපදං සමාදියාමි, සුරාමේරය මජ්ජ පමා දට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි, විකාල භෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි, නච්චගීතවාදිත විසූක දස්සන මාලා ගන්ධවිලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී ශික්ඛාපදං සමාදියාමි. උච්චාසයනා මහාසයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

iv. * ඇස් ඉදිරිපිටම ධනය හානි වෙයි.
* කලහ වඩවයි.
* ලෙඩ රෝග වැඩිවෙයි.
* අප කීර්තිය ඇතිවෙයි.
* ලජ්ජාව නැති වෙයි.

* ප්‍රඥාව දුර්වල කරයි.

v. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සමජීවිකතාව විග්‍රහ කර ඇත. ''ව්‍යග්ඝපජ්ජය මේ ලෝකයෙහි කුල පුත්‍රයෙක් භෝගයන්ගේ, වස්තූන්ගේ අය ද වැය ද දැන ඉතා වැඩිත් නොකොට අඩුත් නොකොට සමවදිවිගෙවයි. මෙසේ මාගේ අය වැය ඉක්මවා සිටි. මෙසේ මගේ වැය අය ඉක්මවා නොසිටී'' යනුවෙන් මූලාශ්‍රයේ විග්‍රහ වෙයි. අයට වඩා වැය නොකර ජීවත් වීම මින් අපේක්ෂා කෙරේ.
(අයංච භෝගානං විදිත්වා වයංච භෝගානං විදිත්වා සමජීවිකං කප්පේති)

## II කොටස

04. i.
* ස්වධර්ම යනු බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව ඒ ඒ වර්ණයන්ට අයත් වූ කාර්යයන්ය.
* මනුස්මෘතියේ සඳහන් පරිදි බ්‍රාහ්මණ ක්‍ෂත්‍රිය, වෛශ්‍ය ශුද්‍ර යන සිවු කුලයේ සාමාජිකයන්ට පැවරී තිබූ කටයුතු වෙන්වෙන්ව සඳහන් කළ යුතුය.
* ස්වකීය වර්ණයට අයත් ''ස්වධර්ම'' වැරදි ලෙස හෝ කිරීම අන්‍ය වර්ණයක ධර්මයක් මනාව සම්පූර්ණ කිරීමට වඩා විශිෂ්ට බව මනුස්මෘතියේ අවධාරණය කර ඇත.

ii. බිරිඳක ලෙස :
* සිගාලෝවාද සූත්‍රයේ ස්වාමි භාර්යා, යුතුකම් තුළින් කාන්තාව බිරිඳක ලෙස ඇගයීමට ලක් කර තිබීම.
* විශාඛාවට තම පියා දුන් අවවාද බුදුරදුන් ද අගය කර ඇත.
* චතු සංවාස සූත්‍රයේ යහපත් බිරිඳ අගය කිරීම
* සත්ත භරියා සූත්‍රයේ බිරින්දෑවරු හත්දෙනෙකු අතරින් යහපත් භාර්යාවන් හතර දෙනකු අගය කිරීම.

මවක ලෙස :-
* මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණයන්ගෙන් යුක්ත බව.
* බ්‍රහ්ම, පූර්වාචාර්ය, ආහුනෙය්‍ය වැනි ගුණාංගයන්ගෙන් යුක්ත බව
* මවුපියන් පූර්ව දිසාවෙන් දක්වා තිබීම
(මාතා පිතා දිසා පුබ්බා....)
* දෙමවුපියන්ට උපස්ථාන කිරීම මංගල කරුණක් බව මංගල සූත්‍රයේ සඳහන් වේ. (මාතා පිතු උපට්ඨානං....)
* වයස්ගත දෙමාපියන්ට නොසලකා හැරීම
පරාභව හා වසල කරුණු වන බව (වසල හා පරභව සූත්‍රය)
* සිඟාලෝවාද සූත්‍රයේ දරුවන්ගේ යුතුකම් මඟින් දෙමාපියන් අගය කිරීම
* බුදුරජාණන් වහන්සේ ස්වකීය සුළු මව වූ මහා ප්‍රජාපතී ගෝතමියට ගෞරව කිරීම
* මාතෘ දිව්‍ය රාජයාට දහම් දෙසීම.

උපාසිකාවක ලෙස
* විශාකා, සාමාවති, ඛුජ්ජුත්තරා වැනි උපාසිකාවන්ට තනතුරු ප්‍රදානය කිරීම
* අධ්‍යාත්මික විමුක්තිය සඳහා ස්ත්‍රී භාවය බාධාවක් නොවීම.
* පන්සිල්, අටසිල්, ගිහි දසසිල් ආරක්ෂා කරමින් ගුණවත් ජීවිතයක් ගත කිරීමට හැකියාව ලැබීම.

05. i.
* ස්වධර්ම සංකල්පය තුළින් අධ්‍යාපනික, ආගමික සාමාජික ආර්ථික අයිතීන් අහිමි විය.
* දාස මෙහෙවර පමණක් ඔවුන්ට හිමිවිය.
* ආශ්‍රම ධර්ම සඳහා අවස්ථාව නොලැබුණු අතර උපනයනය ඇතුළු කිසිම ආගමික කටයුත්තකට සම්බන්ධ විය නොහැකි විය.
* වේදපාඨ ගායනය, සවන් දීම, තහනම් වූ අතර ආර්ථික අයිතීන් ද අහිමි විය.
* ශුද්‍රයන්ට ලබා දුන් විවිධ දඬුවම් පිළිබඳව ද මනුස්මෘතියේ සඳහන් වේ.

ii.
* කෘෂි කර්මාන්තය බමුණන් විසින් වෛශ්‍යයන්ට පවරා තිබුණි.
* බුද්ධකාලය වන විට ක්‍ෂත්‍රියයන්ට කෘෂි කර්මාන්තය පැවරී තිබුණි. (''ඛෙත්තා නං ආධිපතිති ඛත්තියෝ)
* රජුගේ සහභාගිත්වයෙන් වප්මගුල් උත්සවය සිදු කිරීම
* කෘෂිකර්මාන්තයට අදාල ''ඕදන'' (බත) යන වචනය ඇසුරෙන් රජවරුන්ට නම් යොදා තිබුණි.
උදා : සුද්ධෝදන, අමිතෝදන, මිතෝදන, ධෝතෝදන
* කාසිභාරද්වාජ සූත්‍රය ඇසුරෙන් කරුණු ඉදිරිපත් කිරීම.
* කූටදන්ත සූත්‍රයෙහි කෘෂිකර්මාන්තයේ නියැලි ගොවීන්ට බිත්තර වී ආහාර (බීජ භත්තං) රජු විසින් ලබා දිය යුතු බව සඳහන් වීම.
* කෘෂි භාණ්ඩ, සම්පත්, හිමිකරුවන් බුද්ධකාලයේ සිටුවරුන් වී සිටි බව.
* කෘෂිකර්මාන්තයට අත්‍යවශ්‍ය වූ ජලය බෙදා ගැනීම සඳහා ශාක්‍ය කෝලිය වංශවතුන් රෝහිණී නදිය මුල් කරගෙන ගැටුම් ඇති කර ගත් බව
* මගධ කෙතට අනුව භික්ෂූන්ගේ සිවුරු සැකසීමට උපදෙස් දීම.

06. i. * බුදු දහම සෞන්දර්ය රසාස්වාදය අගය කර ඇත.
* මිනිසාට සුවදායක, ප්‍රීතිමත් දිවිපෙවතක් සඳහා බුදුසමය නිරතුරුව උපදෙස් දෙයි.
* ලොව විචිත්‍ර දෑ කාමයෝ නොවෙති පුද්ගලයෙකු තුළ පවතින රාග සංකල්පය කාමයයි. ලොව ඇති විචිත්‍ර වස්තූන් එසේ පවතින අතර නුවණැත්තෝ ඒ වස්තූන් කෙරෙහි ඇති ඇලීම දුරු කරයි.
(''නතේ කාමායානි චිත්‍රානි ලෝකේ
සංකල්පරාගෝ පුරිසස්ස කාමෝ
තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලෝකේ
අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දං'')
* වීතරාගී රහතන් වහන්සේ සෞන්දර්යය උපාදාන රහිතව අත් විඳින ලද අවස්ථා පෙළදහමෙහි සඳහන්වේ.)
* සංවේදිත්වය හා බුද්ධිසංකලනය වූ ආකල්පයකින් යමක් වින්දනය කිරීම සෞන්දර්ය රසාස්වාදයයි.
* බෞද්ධ චින්තනයට අනුව පුද්ගලයාගේ චරිතය ශ්‍රද්ධාවෙන් හා ප්‍රඥාවෙන් පෝෂණය විය යුතුය.
* පුද්ගලයාගේ සංවේදාත්මක අංශය සංවර්ධනය වීමෙන් ශ්‍රද්ධාව, මෛත්‍රිය, කරුණාව, දයාව, මෘදු බව අනුකම්පාව ආදී මානුසික ගුණාංග විකසිත වෙයි.
* මලක වර්ණය මෙන්ම සුගන්ධය විඳ ගැනීමට හැකි වන්නේ එහි සුන්දරත්වය දකින ප්‍රබුද්ධයාට පමණි. යථාර්ථය තුළ ගැබ් වී ඇති සුන්දරත්වය යථාර්ථවාදීව අවබෝධ කර ගැනීමට ඇති හැකියාව සෞන්දර්ය රසාස්වාදය ලෙස හඳුනා ගත හැකිය.

ii. * සිඟාලෝවාද සූත්‍රයෙහි සේව්‍යයාගේ යුතුකම් මෙසේ දක්වේ.
1. සේවකයාගේ ශක්තියට අනුව වැඩ පැවරීම
(යථා බලං කම්මන්ත සංවිධානේන)
2. බත් වැටුප් දීම (භත්ත වේතනානුප්පදානේන)
3. ලෙඩ වූ විට සැලකීම (ගිලානුපට්ඨානේන)
4. රස ආහාර ලද විට බෙදා දීම
(අච්ඡරියානං රසානං සංවිභාගේන)
5. සුදුසු අවස්ථාවන්හි විවේක ලබාදීම.
(සමයේ වොස්සග්ගේන)

සේවකයාගේ යුතුකම්
1. ස්වාමියාට පළමුව නැගිටීම (උදෑසනින් සේවයට පැමිණීම)
(පුබ්බුට්ඨායිනෝච හොන්ති)
2. ස්වාමියාට පසුව නින්දට යාම (පච්ඡානිපාතිනෝච)
3. ස්වාමියා දුන් දේ පමණක් ගැනීම (දින්නාදායිනො)
4. මනා සැලකිල්ලෙන් කටයුතු කිරීම (සුකත කම්මකරා)
5. ස්වාමියාගේ ගුණ කීම. (කිත්තිවණ්ණහරා)

යනාදී ලෙස යුතුකම් ඉටුවන්නේ නම් සේවා ආයතන තුළ පැනනගින අර්බුධ නිරාකරණය කරගත හැකි බව.

07. සග * සුභද්‍ර භික්ෂුවගේ නොමනා ප්‍රකාශය
(අලං ආවුසෝ මා සෝචිත්ත මාපරිදේවිත්ථ.....)
* විසිරීගිය ධර්ම විනය එක් රැස් කිරීමේ අවශ්‍යතාවය.
* ධර්ම විනයෙහි අනාගත ආරක්ෂාව පිණිස ක්‍රියා කිරීමේ අවශ්‍යතාවය.
* බුදුරදුන් ජීවමාන සමයේ පටන් භික්ෂු සංඝයා අතර විවිධ අර්බුධකාරී අවස්ථා පැවතීම.
* අගතනතුරු පිරිනැමීමේ දී,
* දෙව්දත්තෙරුන්ගේ පංචවරය ඉල්ලීම
* ඡන්න තෙරුන් පිළිබඳ තීරණය.
* ආනන්ද හිමියන්ට චෝදනා එල්ල වීම.
* සාති, අරිට්ඨ, ඡබ්බග්ගිය වැනි භික්ෂූන්ගේ ක්‍රියාකාරකම්
* කොසඹෑනුවර ඝෝෂිතාරාමයේ ධර්මධර විනය ධර ගැටුම
* නිගන්ඨනාතපුත්තයේ අභාවයෙන් පසු එම සසුනෙහි අනුගාමිකයන් භේද වීම ආදී විවිද හේතු මේ සඳහා බලපාන ලද බව

ii. * විනය පිටකය කොටස් පහකට බෙදා උපාලි තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පරපුරට පරපුරෙන් පරපුරට පවත්වාගෙන යාමට භාර කිරීම.
(පාරාජිකාපාලි, පචිත්තියපාලි, චුල්ලවග්ග පාලි, මහාවග්ගපාලි. පරිවාර පාලි)

* සූත්‍ර පිටකය කොටස් පහකට බෙදා අනාගත ආරක්ෂාව සඳහා භාණක පරපුරකට භාර කර ඇත.
  දීඝනිකාය : ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට
  මජ්ඣිම නිකාය : සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පිරිසට
  සංයුක්ත නිකාය : මහාකාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට
  අංගුත්තර නිකාය : අනුරුද්ධ තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට
  ඛුද්දක නිකාය : පොදුවේ සියලු භික්ෂූන් වහන්සේලාට
* ඛුද්දානු ඛුද්දක ශික්ෂාපද වෙනස් නොකර බුදුරජාණන් වහන්සේ දෙසූ සියලු ශික්ෂා පද එලෙසින්ම සුරැකීමට තීරණය කිරීම
* ඡන්න හිමියන්ට බ්‍රහ්ම දණ්ඩය පැනවීම
* මෙම කරුණු ධර්ම විනයෙහි සුරක්ෂිත බව සඳහා හේතු විය.

08. i.
* මහා වංශය, දීපවංශය, සමන්තපාසාදිකාව වැනි ශ්‍රී ලංකාවේ මූලාශ්‍රවල අශෝක බෞද්ධයකු බව සඳහන් වී ඇත.
* නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගෙන් දහම් අසා බෞද්ධයකු වූ බව
* මස්කි හා බ්‍රහ්මගිරි ලිපිවල අශෝක බෞද්ධයකු බව සඳහන් වී ඇත.
* මා ශාක්‍ය මුනින්ද්‍රයන් වහන්සේගේ අනුගාමිකයකු වී වසර දෙකහමාරකට වැඩිය. සංඝයා වහන්සේ වෙත එළඹ වසරකට වැඩිය මම වැඩිදියුණුවට පත් වීමි. (මස්කි ලිපිය)
* පුතා හා දියණිය පැවිදි කිරීම
* තමා තොරුන් සරණ ගිය බවත් ඔබ ද තෙරුන් සරණ යා යුතු බවත් සඳහන් කරමින් දෙවන පෑතිස් රජුට හසුන් පතක් එවීම.
* මොග්ගලී පුත්ත තිස්ස තෙරුන් සමඟ සම්බන්ධ වී සසුන පිරිසිදු කිරීමට ක්‍රියා කිරීම
* තෙවන ධර්ම සංගීතියට දායකත්වය දැක්වීම.
* නව රට සසුන් පිහිටු වීමට සහාය වීම
* ලුම්බිණිය අයබද්දෙන් නිදහස් කිරීම
* බෞද්ධ සිද්ධස්ථාන වැඳ පුදා ගැනීම.
* බෞද්ධ සූත්‍රවල ඇතුළත් කරුණු පදනම් කර ගනිමින් සෙල්ලිපි පිහිටු වීම.

ii.
* ක්‍රි:ව 415 - 455 අතර රජකළ ශක්‍රාදිත්‍ය හෙවත් පළමු වන කුමාර ගුප්ත රජු නාලන්දාව ආරම්භ කිරීම.
* බුද්ධ ගුප්ත, තථාගත ගුප්ත, (වික්‍රමාදිත්‍ය) බාල දිත්‍ය (නරසිංහ ගුප්ත) වජ්‍ර (කුමාරගුප්ත) වැනි රජවරු පසු කාලයේ නාලන්දාවේ දියුණුව සඳහා කටයුතු කිරීම.
* නාගර්ජුන, ආර්ය දේව වැනි මහ දාර්ශනිකයන් නාලන්දාවේ විසූ බව
* ක්‍රි.ව. 7 වන සියවසේ දස දහසකට නේවාසික පහසුකම් සහිත සුවිශාල අධ්‍යාපන ආයතනයක් වීම.
* රත්නසාගර රත්නෝදය, රත්නරඤ්ජන යන නම්වලින් යුතු පහසුකම් සහිත පුස්තකාලය තට්ටු නවයකින් හා වන්දිර තුනකින් යුක්ත විය.
* ආකාශ වස්තු පර්යේෂණාගාරයක්, රසායනාගාරයක් වෛද්‍ය විද්‍යාලයක්, රෝගී නේවාසිකාගාරයක් පැවතීම.
* හියුංසියැං වාර්තා අනුව ආචාර්ය ශිෂ්‍ය, සේවක යන නේවාසික පිරිස දස දහසකට අධික විය. එයින් 1500 කට අධික සේවක පිරිසක් සිටී බව.
* විෂය ධාරා 5 ක් යටතේ ඉගැන්වීම.
* විවිධ විෂයයන් හා විවිධ ඉගැන්වීම් ක්‍රම භාවිතා කිරීම ද මෙහි සාර්ථකත්වය සඳහා බලපෑවේය.
* නේවාසික පහසුකම් සහිත නිදහස් අධ්‍යාපනයක් ක්‍රියාත්මක වීම යනාදී කරුණු රැසක් මෙහි සාර්ථකත්වය සඳහා බලපෑවේය.